කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

නිවේදන අංකය : **22** WW/TC/30/11/24/03
වර්ණය : ඇම්බර්

## ෆෙන්ගල් (FENGAL) සුළිකුණාටුව පිළිබඳ අවවාදාත්මක නිවේදනය

**කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ, ස්වභාවික විපත් පිළිබඳ පූර්ව අනතුරු ඇඟවීමේ මධ්‍යස්ථානය විසින්**
2024 දෙසැම්බර් මස 01 දින පෙ. ව. 05.00 දක්වා වලංගු වන පරිදි
2024 නොවැම්බර් මස 30 වන දින ප. ව. 05.00 ට නිකුත් කරන ලදී.

### දිවයින වටා වන ගැඹුරු හා නොගැඹුරු මුහුදු ප්‍රදේශ සහ ගොඩබිම සඳහා අවධානයෙන් සිටින්න!

**නිරිත දිග බෙංගාල බොක්ක ප්‍රදේශයේ පවතින ෆෙන්ගල්(FENGAL) සුළිකුණාටුව 2024 නොවැම්බර් 30 වැනි දින ප.ව. 02.30 පමණ වන විට ත්‍රිකුණාමලයට කිලෝමීටර් 420ක් පමණ උතුරු දෙසින් සහ කන්කසන්තුරය සිට කිලෝමීටර් 280 පමණ උතුරු දෙසින් පිහිටා තිබුණි. එය බස්නාහිරට බරව වයඹ දෙසට ගමන් කරමින් නොවැම්බර් 30 දින සවස් කාලයේදී උතුරු තමිල්නාඩු- පුදුචෙරි වෙරළ වෙත ළඟා වනු ඇත. මෙම පද්ධතිය ඉන්දියාව තුලට ගමන් කරමින් ක්‍රමයෙන් දුර්වල වනු ඇති අතර දිවයිනේ කාලගුණයට එමගින් ඇතිවන බලපෑම තවදුරටත් අඩු වෙමින් පවතී.**

උතුරු පළාතේ අහස වලාකුලින් බරව පවතින අතර විටින් විට වැසි හෝ ගිගුරුම් සහිත ඇති වේ. ඇතැම් ස්ථානවලට **මි.මී. 50**ට වැඩි තරමක් තද වැසි ඇතිවිය හැක.

බස්නාහිර, සබරගමුව, වයඹ සහ උතුරු-මැද පළාත්වලත් මහනුවර, නුවර එළිය, ගාල්ල සහ මාතර දිස්ත්‍රික්කවලත් වැසි වාර කිහිපයක් ඇතිවේ. සෙසු ප්‍රදේශවල සවස් කාලයේදී හෝ රාත්‍රී කාලයේදී ස්ථාන ස්වල්පයක වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇතිවිය හැක.

උතුරු, උතුරුමැද, වයඹ, බස්නාහිර, මධ්‍යම සහ දකුණු පළාත්වල විටින් විට හමන පැ.කි.මී. (50-55) ක පමණ තද සුළං ඇතිවිය හැක.




**පද්ධතියේ නිරීක්ෂණය සහ පුරෝකථනය කළ ගමන් මාර්ගය (මූලාශ්‍රය: RSMC-IMD)**

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

පද්ධතියේ පුරෝකථන මාර්ගය සහ තීව්‍රතාවය

| දිනය/වේලාව (ශ්‍රී ලංකා පැය) | ස්ථානය (උතුරු අක්ෂාංශ °N නැගෙනහිර දේශාංශ °E) | උපරිම සුළඟේ වේගය (පැයට කි. මී.) | ස්වභාවය |
|---|---|---|---|
| 30.11.24/1730 | 12.2/80.1 | 70-80 විටින් විට 90 දක්වා | සුළිකුණාටුව |
| 30.11.24/2330 | 12.1/79.8 | 55-65 විටින් විට 75 දක්වා | ගැඹුරු පීඩන අවපාතයක් |
| 01.12.24/0530 | 12.0/79.5 | 50-60 විටින් විට 70 දක්වා | ගැඹුරු පීඩන අවපාතයක් |

Warning for Fishing and Naval Communities
issued at 05.00 p.m. on 30 November 2024, valid for next 12 hours




**<u>සැලකිලිමත් වන්න:</u>**

**මුහුදු ප්‍රදේශ:**

- ත්‍රිකුණාමලය සිට කන්කසන්තුරය හරහා පුත්තලම දක්වා වෙරළට ඔබ්බෙන් වන ගැඹුරු සහ නොගැඹුරු මුහුදු ප්‍රදේශවල සුළඟේ වේගය ක්ෂණිකව පැ.කි.මී. (60-70) පමණ දක්වා ඉහළ යාමට ඉඩ ඇති හෙයින් එම මුහුදු ප්‍රදේශය විටින් විට රළු හෝ ඉතා රළු විය හැක. එම මුහුදු ප්‍රදේශවල ඇතැම් ස්ථානවලට ඉතා තද වැසි හෝ ගිගුරුම් සහිත වැසි පැවතිය හැක.

- පුත්තලම සිට ගාල්ල හරහා හම්බන්තොට දක්වා වෙරළට ඔබ්බෙන් වන මුහුදු ප්‍රදේශවල මුහුදු රළ උස **මීටර් (2.5 – 3.0)** ක් පමණ ඉහළ යාමේ හැකියාවක් පවතී. (මෙය ගොඩබිමට එන රළ උස නොවේ).

- **නැවත දැනුම් දෙන තුරු ත්‍රිකුණාමලය සිට කන්කසන්තුරය හරහා පුත්තලම දක්වා වෙරළට ඔබ්බෙන් වන ගැඹුරු සහ නොගැඹුරු මුහුදු ප්‍රදේශවල ධීවර සහ නාවුක කටයුතුවලින් වැළකී සිටින ලෙස දැනුම් දෙනු ලැබේ.**

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

**ගොඩබිම ප්‍රදේශ:**

**ඉදිරි දින තුන සඳහා තද සුළං පිළිබඳ අනතුරු ඇඟවීම.**

| පළාත | නොවැම්බර් 30 | දෙසැම්බර් 01 | දෙසැම්බර් 02 |
|---|---|---|---|
| උතුර | විටින් විට පැ.කි.මී.(50-55) පමණ දක්වා වන තද සුළං | විටින් විට පැ.කි.මී.(50-55) පමණ දක්වා වන තද සුළං | විටින් විට පැ.කි.මී.(50-55) පමණ දක්වා වන තද සුළං |
| උතුරු-මැද | විටින් විට පැ.කි.මී.(50-55) පමණ දක්වා වන තද සුළං | විටින් විට පැ.කි.මී.(50-55) පමණ දක්වා වන තද සුළං | විටින් විට පැ.කි.මී.(40-50) පමණ දක්වා වන තද සුළං |
| නැගෙනහිර | විටින් විට පැ.කි.මී.(30-40) පමණ දක්වා වන තද සුළං | පැ.කි.මී.(30-40) පමණ දක්වා වන තරමක තද සුළං | පැ.කි.මී.(30-40) පමණ දක්වා වන තරමක තද සුළං |
| සබරගමුව | පැ.කි.මී.(30-40) පමණ දක්වා වන තරමක තද සුළං | පැ.කි.මී.(40-50) පමණ දක්වා වන තද සුළං | පැ.කි.මී.(30-40) පමණ දක්වා වන තරමක තද සුළං |
| බස්නාහිර | පැ.කි.මී.(30-40) පමණ දක්වා වන තරමක තද සුළං | පැ.කි.මී.(30-40) පමණ දක්වා වන තරමක තද සුළං | පැ.කි.මී.(30-40) පමණ දක්වා වන තරමක තද සුළං |
| දකුණ | විටින් විට පැ.කි.මී.(40-50) පමණ දක්වා වන තද සුළං | විටින් විට පැ.කි.මී.(50-55) පමණ දක්වා වන තද සුළං | විටින් විට පැ.කි.මී.(40-50) පමණ දක්වා වන තද සුළං |
| ඌව | පැ.කි.මී.(30-40) පමණ දක්වා වන තරමක තද සුළං | පැ.කි.මී.(30-40) පමණ දක්වා වන තරමක තද සුළං | පැ.කි.මී.(30-40) පමණ දක්වා වන තරමක තද සුළං |
| වයඹ | විටින් විට පැ.කි.මී.(40-50) පමණ දක්වා වන තද සුළං | පැ.කි.මී.(40-50) පමණ දක්වා වන තරමක තද සුළං | විටින් විට පැ.කි.මී.(40-50) පමණ දක්වා වන තද සුළං |
| මධ්‍යම | පැ.කි.මී.(40-50) පමණ දක්වා වන තරමක තද සුළං | පැ.කි.මී.(50-55) පමණ දක්වා වන තරමක තද සුළං | විටින් විට පැ.කි.මී.(40-50) පමණ දක්වා වන තද සුළං |

**ඉදිරි දින තුන සඳහා තද වැසි පිළිබඳ අනතුරු ඇඟවීම**

| පළාත | දිස්ත්‍රික්කය | නොවැම්බර් 30 | දෙසැම්බර් 01 | දෙසැම්බර් 02 |
|---|---|---|---|---|
| උතුර | මුලතිව් | විටින් විට වැසි | වැසි වාර කිහිපයක් | වැසි ස්වල්පයක් ඇතිවිය හැක. |
| | යාපනය | විටින් විට වැසි | වැසි වාර කිහිපයක් | වැසි ස්වල්පයක් ඇතිවිය හැක. |
| | වවුනියා | වැසි වාර කිහිපයක් | වැසි ස්වල්පයක් ඇතිවිය හැක. | ප්‍රධාන වශයෙන් වැසි රහිත |
| | මන්නාරම | විටින් විට වැසි | වැසි වාර කිහිපයක් | වැසි ස්වල්පයක් ඇතිවිය හැක. |
| | කිලිනොච්චි | විටින් විට වැසි | වැසි වාර කිහිපයක් | වැසි ස්වල්පයක් ඇතිවිය හැක. |
| උතුරු මැද | අනුරාධපුරය | වැසි ස්වල්පයක් ඇතිවිය හැක. | වැසි ස්වල්පයක් ඇතිවිය හැක. | ප්‍රධාන වශයෙන් වැසි රහිත |
| | පොළොන්නරුව | වැසි ස්වල්පයක් ඇතිවිය හැක. | ප්‍රධාන වශයෙන් වැසි රහිත | ප්‍රධාන වශයෙන් වැසි රහිත |
| නැගෙනහිර | ත්‍රිකුණාමලය | වැසි ස්වල්පයක් ඇතිවිය හැක. | ප්‍රධාන වශයෙන් වැසි රහිත | ප්‍රධාන වශයෙන් වැසි රහිත |
| | අම්පාර | සවස් කාලයේදී හෝ රාත්‍රී කාලයේදී වැසි හෝ ගිගුරුම් සහිත වැසි | ප්‍රධාන වශයෙන් වැසි රහිත | ප්‍රධාන වශයෙන් වැසි රහිත |
| | මඩකලපුව | සවස් කාලයේදී හෝ රාත්‍රී කාලයේදී වැසි හෝ ගිගුරුම් සහිත වැසි | ප්‍රධාන වශයෙන් වැසි රහිත | ප්‍රධාන වශයෙන් වැසි රහිත |

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

| | | | | |
|---|---|---|---|---|
| සබරගමුව | රත්නපුර | විටින් විට වැසි | වැසි ස්වල්පයක් ඇතිවිය හැක. | වැසි ස්වල්පයක් ඇතිවිය හැක. |
| | කෑගල්ල | විටින් විට වැසි හෝ ගිගුරුම් සහිත වැසි | වැසි ස්වල්පයක් ඇතිවිය හැක. | වැසි ස්වල්පයක් ඇතිවිය හැක. |
| බස්නාහිර | කොළඹ | විටින් විට වැසි | ප්‍රධාන වශයෙන් වැසි රහිත | ප්‍රධාන වශයෙන් වැසි රහිත |
| | කළුතර | විටින් විට වැසි | වැසි ස්වල්පයක් ඇතිවිය හැක. | ප්‍රධාන වශයෙන් වැසි රහිත |
| | ගම්පහ | විටින් විට වැසි | ප්‍රධාන වශයෙන් වැසි රහිත | ප්‍රධාන වශයෙන් වැසි රහිත |
| දකුණ | ගාල්ල | විටින් විට වැසි | වැසි ස්වල්පයක් ඇතිවිය හැක. | ප්‍රධාන වශයෙන් වැසි රහිත |
| | මාතර | විටින් විට වැසි | වැසි ස්වල්පයක් ඇතිවිය හැක. | ප්‍රධාන වශයෙන් වැසි රහිත |
| | හම්බන්තොට | විටින් විට වැසි | ප්‍රධාන වශයෙන් වැසි රහිත | ප්‍රධාන වශයෙන් වැසි රහිත |
| ඌව | මොණරාගල | සවස් කාලයේදී හෝ රාත්‍රී කාලයේදී වැසි හෝ ගිගුරුම් සහිත වැසි | ප්‍රධාන වශයෙන් වැසි රහිත | ප්‍රධාන වශයෙන් වැසි රහිත |
| | බදුල්ල | සවස් කාලයේදී හෝ රාත්‍රී කාලයේදී වැසි හෝ ගිගුරුම් සහිත වැසි | ප්‍රධාන වශයෙන් වැසි රහිත | සවස් කාලයේදී හෝ රාත්‍රී කාලයේදී වැසි හෝ ගිගුරුම් සහිත වැසි |
| වයඹ | කුරුණෑගල | වැසි වාර කිහිපයක් | ප්‍රධාන වශයෙන් වැසි රහිත | ප්‍රධාන වශයෙන් වැසි රහිත |
| | පුත්තලම | වැසි වාර කිහිපයක් | ප්‍රධාන වශයෙන් වැසි රහිත | ප්‍රධාන වශයෙන් වැසි රහිත |
| මධ්‍යම | මහනුවර | සවස් කාලයේදී හෝ රාත්‍රී කාලයේදී වැසි හෝ ගිගුරුම් සහිත වැසි | ප්‍රධාන වශයෙන් වැසි රහිත | ප්‍රධාන වශයෙන් වැසි රහිත |
| | නුවරඑළිය | විටින් විට වැසි | වැසි ස්වල්පයක් ඇතිවිය හැක. | ප්‍රධාන වශයෙන් වැසි රහිත |
| | මාතලේ | වැසි වාර කිහිපයක් | ප්‍රධාන වශයෙන් වැසි රහිත | ප්‍රධාන වශයෙන් වැසි රහිත |

අවදානම් රහිත　　අඩු අවදානම්　　මධ්‍ය අවදානම්　　අධි අවදානම්

**මුහුදු ප්‍රදේශ සඳහා අනුගමනය කල යුතු ක්‍රියාමාර්ග:**

- නැවත දැනුම් දෙන තුරු ත්‍රිකුණාමලය සිට සහ කන්කසන්තුරය හරහා පුත්තලම දක්වා වෙරළට ඔබ්බෙන් වන ගැඹුරු සහ නොගැඹුරු මුහුදු ප්‍රදේශවල ධීවර සහ නාවුක කටයුතුවලින් වැළකී සිටින ලෙස දැනුම් දෙනු ලැබේ.
- කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව මගින් මේ සම්බන්ධව නිකුත් කරන ඉදිරි නිවේදන පිළිබඳ අවධානය යොමුකරන ලෙස ඉල්ලා සිටිනු ලැබේ.

**ගොඩබිම ප්‍රදේශය සඳහා අනුගමනය කල යුතු ක්‍රියාමාර්ග:**

- හදිසි තත්වයකදී ප්‍රාදේශීය ආපදා කළමනාකරණ මධ්‍යස්ථාන නිලධාරීන් ගේ සහය පතන්න.
- කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව මගින් මේ සම්බන්ධව නිකුත් කරන ඉදිරි නිවේදන පිළිබඳ අවධානය යොමුකරන ලෙස ඉල්ලා සිටිනු ලැබේ.